# ආර්ථික විද්‍යාව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 11.සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායකවීමේ ඇල්ම
## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1. ආර්ථික වෘද්ධිය වඩාත් හොඳින් පැහැදිලි කෙරෙනුයේ ,
   (1) නිෂ්පාදන හැකියා මායිමෙන් පිටත ලක්ෂ්‍යයක කටයුතු කිරීම හා දිගු කාලීන සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමක් ලෙස ය.
   (2) නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වීම සහ දිගු කාලීන සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කිරීමක් ලෙස ය.
   (3) නිෂ්පාදන හැකියා මායිම සහ දිගු කාලීන සැපයුම් වක්‍රය යන දෙක ම දකුණට විතැන් වීමක් ලෙස ය.
   (4) නිෂ්පාදන හැකියා මායිම සහ දිගු කාලීන සැපයුම් වක්‍රය යන දෙක ම වමට විතැන් වීමක් ලෙස ය.
   (5) නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වීම සහ දිගු කාලීන සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමක් ලෙස ය.

2. ආර්ථික වෘද්ධි තීරකයන් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) සම්පත් සම්භාරය, සාධක ඵලදායිතාවය සහ ආර්ථික ස්ථායිකරණය
   (2) සම්පත් සම්භාරය , පූර්ණ සේවා නියුක්තිය සහ සාධක ඵලදායීතාවය
   (3) සාධක ඵලදායීතාවය , සේවා වියුක්ති අනුපාතය සහ සම්පත් සම්භාරය
   (4) සේවා වියුක්ති අනුපාතය, පූර්ණ සේවා නියුක්තිය සහ සම්පත් සම්භාරය
   (5) විභව නිමැවුම, සැබෑ නිමැවුම සහ සමාහාර සැපයුම

3. ආර්ථික වෘද්ධියක දී සැබැවින් ම සිදුවිය යුත්තේ,
   (1) සමාහාර ඉල්ලුමේ හා සැපයුමේ වැඩි වීමක්ය
   (2) මූර්ත නිමැවුම දිගු කාලීන ව ඉහළ යාමක්ය
   (3) පූර්ණ සේවා නියුක්තිය අත්පත් කර ගැනීමක්ය
   (4) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ ලා ආර්ථිකය සතු ධාරිතාවය ප්‍රසාරණය වීමක්ය
   (5) භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාවය ප්‍රසාරණය වීමක්ය

4. රටක ආර්ථික වෘද්ධිය මැනීම සඳහා යොදාගනු ලබන වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස වනුයේ,
   (1) නාමික දළ දේශීය නිෂ්පාදිතය.
   (2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය.
   (3) නාමික ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය.
   (4) වැය කළ හැකි ප්‍රතිශීර්ෂ ආදායම
   (5) ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රතිශීර්ෂ ආදායම

5. ආර්ථික වෘද්ධියේ ආවස්ථික පිරිවැය ලෙස බිහි විය හැක්කේ කුමක්ද?
    (1) නිමැවුම හා සේවා නියුක්තිය ඉහළ යාම.
    (2) සේවා වියුක්ති අනුපාතිකය පහළ යාම.
    (3) වර්තමාන පාරිභෝජනය පහළ යාම.
    (4) ඉතුරුම් අනුපාතිකය පහළ යාම.
    (5) වර්තමාන ආයෝජනය ඉහළ යාම.

6. 2019 වසරේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික , කාර්මික හා සේවා යන අංශ විසින් වර්තන මිලට දළ දේශීය නිෂ්පාදිතයට දැක්වූ දායකත්වය පිළිවෙළින් දැක්වූ විට,
    (1) 7.4 % , 27.4 % හා 58.2 % වේ.
    (2) 27.4 % , 7.4 % හා 58.2 % වේ.
    (3) 58.2 % , 27.4 % හා 7.4 % වේ.
    (4) 7.4 % , 58.2 % හා 27.4 % වේ.
    (5) 58.2 % , 7.4 % හා 27.4 % වේ.

7. එක්තරා ආර්ථිකයකට අදාල පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | |
|---|---|
| 2019 වර්තන මිලට දළ දේශීය නිෂ්පාදිතය | රු.මි. 5250 |
| 2019 ගම්‍ය මිල දර්ශකය | 125 |
| 2018 වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය | රු.මි. 4000 |

ඉහත තොරතුරු අනුව 2019 වසරේ මෙම ආර්ථිකයේ ආර්ථික වෘද්ධි අනුපාතිකය
    (1) 5 % කි.
    (2) 8 % කි.
    (3) 12 %කි.
    (4) 25 % කි.
    (5) 32 % කි.

8. රටක ආර්ථික වෘද්ධියක් ඇති වීමේ වාසි මෙන් ම ඇතැම් අවාසි ද බිහි වන අවස්ථා පවතී. පහත දැක්වෙන කවරක් ආර්ථික වෘද්ධියේ අවාසියක් ලෙස හඳුනා ගන්නේ ද?
    (1) ආදායම ඉහළ යාම.
    (2) උද්ධමනය ඉහළ යාම .
    (3) දරිද්‍රතාව පහළ යාම.
    (4) විරැකියාව පහළ යාම.
    (5) අයවැය හිඟය පහළ යාම.

9. රටවල් ආර්ථික වශයෙන් සැසැඳීම සහ වර්ගීකරණය කිරීම සඳහා ලෝක බැංකුව විසින් යොදා ගන්නා නිර්ණායකය වන්නේ කුමක් ද?

    (1) ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
    (2) ක්‍රය ශක්ති සාම්‍යය අනුව ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
    (3) ක්‍රය ශක්ති සාම්‍යය අනුව ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ දේශීය ආදායම
    (4) ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය
    (5) ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය

10. පහත ප්‍රකාශ අතුරින් ආර්ථික සංවර්ධනය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
    (1) ආර්ථික වෘද්ධිය හා බැඳුණු ව්‍යුහාත්මක වෙනස්කම් රැසක් ආර්ථික සංවර්ධනයේ දී සිදු වේ.
    (2) කෘෂි අංශයේ සාපේක්ෂ දායකත්වය අඩු වීම ආර්ථික සංවර්ධනයේ දී සිදුවන වෙනස්කමකි.
    (3) ආර්ථික වෘද්ධියකින් තොරව ආර්ථික සංවර්ධනයක් අත්කර ගත නොහැක.
    (4) ආර්ථික වෘද්ධිය සමග රටක ජනතාවගේ ජීවන මට්ටමේ සිදු වන අඛණ්ඩ වර්ධනයක් සංවර්ධනයයි.
    (5) නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වීමක් මගින් ආර්ථික සංවර්ධනය නිරූපණය කෙරේ.

11. අනාගත පරපුරේ ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත වන පරිදි වර්තමාන ජනතාවගේ අවශ්‍යතා සපුරා ගැනීම,
    (1) දිළිඳුකමට හිතෛෂී ආර්ථික වෘද්ධිය වේ.
    (2) මානව සංවර්ධනය වේ.
    (3) තිරසාර සංවර්ධනය වේ.
    (4) ආර්ථික සංවර්ධනය වේ.
    (5) සාර්ව සහභාගීත්ව වෘද්ධිය වේ.

12. 2019 මානව සංවර්ධන වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය හා ශ්‍රී ලංකාව හිමි කර ගත් ස්ථානය පිළිවෙළින් ,
    (1) 0.715 සහ 92
    (2) 0.752 සහ 91
    (3) 0.757 සහ 73
    (4) 0.770 සහ 76
    (5) 0.780 සහ 71

13. එක්සත් ජනපද ඩොලර් ඇසුරින් ප්‍රකාශිත ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම පදනම් කර 2019 දී ශ්‍රී ලංකාව ඉහළ මැද ආදායම් ලබන රටවල් කාණ්ඩයට ඉහළ නංවන ලදි. මෙම කාණ්ඩයට අදාළ ඒක පුද්ගල ආදායම් පරාසය එක්සත් ජනපද ඩොලර්,
    (1) 1025 – 3995 අතර වේ.
    (2) 1046 - 4125 අතර වේ.
    (3) 3996 – 12375 අතර වේ.
    (4) 4126 - 12735 අතර වේ.
    (5) 3956 – 12235 අතර වේ.

14. රටක සංවර්ධනය මැනීම සඳහා භාවිතා කෙරෙන සංයුක්ත දර්ශක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) මානව සංවර්ධන දර්ශකය, ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
    (2) ක්‍රය ශක්ති සාම්‍ය දළ දේශීය නිෂ්පාදිතය, භෞතික ජීවන තත්ත්ව දර්ශකය
    (3) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය, ජනගහණ දරිද්‍රතා දර්ශකය
    (4) මානව සංවර්ධන දර්ශකය, භෞතික ජීවන තත්ත්ව දර්ශකය
    (5) දළ උපත් අනුපාතිකය, ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම

15. භෞතික ජීවන තත්ත්ව දර්ශකයේ සීමාවක් වන්නේ,
    (1) සෞඛ්‍යය හා පෝෂණය කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වීම.
    (2) සෞඛ්‍යය හා පෝෂණය කෙරෙහි අඩු නැඹුරුවක් දැක්වීම.
    (3) නිෂ්පාදනය කෙරෙහි අඩු නැඹුරුවක් දැක්වීම.
    (4) අධ්‍යාපනය කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වීම.
    (5) සංයුක්ත දර්ශයක් බැවින් රටවල් අතර සංසන්දනය කළ නොහැකි වීම.



වාණිජ පොදු විෂය අධ්‍යයන ශාඛාව

16. මානව සංවර්ධනය පදනම් කර ගන්නා සංවර්ධනයේ ප්‍රධාන අරමුණු නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) නිෂ්පාදනය , සෞඛ්‍යය හා දැනුම
    (2) සෞඛ්‍යය , දැනුම හා ජීවන මට්ටම
    (3) මානව ආරක්ෂාව , දැනුම හා දරිද්‍රතාව
    (4) ජීවන මට්ටම, සෞඛ්‍යය හා දරිද්‍රතාව
    (5) පෝෂණය , සෞඛ්‍යය හා මානව නිදහස

17. මානව සංවර්ධන දර්ශකය අනුව පහළ ම සංවර්ධනය ඇති රටවල් කාණ්ඩය තෝරන්න.
    (1) හංගේරියාව, ඉතියෝපියාව , නේපාලය හා චැඩ් ය.
    (2) හංගේරියාව, බොස්නියාව, බලූකිස්ථානය හා නයිගර් ය.
    (3) සියොරාලියොන් , චැඩ්, කොංගෝ හා නයිජීරියා ය.
    (4) කොංගෝ, ඇෆ්ගනිස්ථානය , බොස්නියාව හා චැඩ් ය.
    (5) නයිජීරියාව, හංගේරියාව, බල්ගේරියාව හා චැඩ් ය.

18. තිරසාර සංවර්ධනයේ දී සලකා බැලෙන පැතිකඩ තුන නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) ආර්ථික , සමාජීය , දේශපාලන පැතිකඩ
    (2) ආර්ථික, සමාජීය , පාරිසරික පැතිකඩ
    (3) ආර්ථික ස්ථායිතාව, සමාජ සංවර්ධනය, යහපාලන පැතිකඩ
    (4) සමාජීය, දේශපාලනික , පාරිසරික පැතිකඩ
    (5) ආර්ථික , සමාජීය , සංස්කෘතික පැතිකඩ

19. තිරසාර සංවර්ධනයේ සමාජීය පැතිකඩෙහි අරමුණක් නොවන්නේ කුමක් ද?
    (1) සාධාරණත්වය
    (2) සහභාගීත්වය
    (3) සමාජ සංචලතාව
    (4) ස්ථායීතාව
    (5) සවිබල ගැන්වීම

20. තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ හා එහි ඉලක්ක සංඛ්‍යාව අනුපිළිවෙළින්,
    (1) 7 හා 69 වේ.
    (2) 8 හා 48 වේ.
    (3) 8 හා 18 වේ.
    (4) 17 හා 69 වේ.
    (5) 17 හා 169 වේ.

21. 2019 වසරේ මෙරට ආර්ථික වෘද්ධි අනුපාතය හා සේවා වියුක්ති අනුපාතිකය පිළිවෙලින්,
    (1) 2.0 % හා 4.2 % වේ.
    (2) 2.2 % හා 4.4 % වේ.
    (3) 2.2 % හා 4.8 % වේ.
    (4) 2.3 % හා 4.8 % වේ.
    (5) 2.3 % හා 4.4 % වේ.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

22. 2019 වසරේ ශ්‍රී ලංකාවේ වැඩිම හා අඩුම ජන ඝනත්වය සහිත දිස්ත්‍රික්ක ලෙස සටහන් වන්නේ,
    (1) කොළඹ සහ මන්නාරම ය.
    (2) කොළඹ සහ මුලතිව් ය.
    (3) ගම්පහ සහ මොණරාගල ය.
    (4) ගම්පහ සහ මුලතිව් ය.
    (5) කොළඹ සහ මොණරාගල ය.

23. සමාජයේ දුප්පත් ම 10% වෙතින් ධනවත් ම 10% කරා ආදායම් පුනර්ව්‍යාප්තියක් සිදුවීම නිසා ලෝරන්ස් වක්‍රය
    (1) 45° රේඛාවට ආසන්න වන අතර , ගිනී සංගුණකය ඉහළ නගී.
    (2) 45° රේඛාවට ආසන්න වන අතර , ගිනී සංගුණකය පහළ බසී.
    (3) 45° රේඛාව වෙතින් දුරස් වන අතර , ගිනී සංගුණකය ඉහළ නගී.
    (4) 45° රේඛාව වෙතින් දුරස් වන අතර , ගිනී සංගුණකය පහළ බසී.
    (5) 45° රේඛාව මත පතිත වන අතර , ගිනී සංගුණකය ශුන්‍ය අගයක් ගනී.

24. ලෝරන්ස් වක්‍රය තවදුරටත් දකුණු පසට විතැන් වීම
    (1) ආදායම් ව්‍යාප්තියේ විෂමතාව අඩු වීමට හේතු වේ.
    (2) ගිනී සංගුණකය ඉහළ යාමට හේතු වේ.
    (3) ගිනී සංගුණකය පහළ යාමට හේතු වේ.
    (4) පහළ ආදායම් ලබන කුටුම්බ වෙත ලැබෙන ආදායම් ප්‍රතිශත ඉහළ යාමට හේතු වේ.
    (5) ඉහළ ආදායම් ලබන කුටුම්බ වෙත ලැබෙන ආදායම් ප්‍රතිශත පහළ යාමට හේතු වේ.

25. ගිනි සංගුණකය මගින් මැනිය හැකි වන්නේ,
    (1) නිරපේක්ෂ දරිද්‍රතා මට්ටමයි.
    (2) සාපේක්ෂ ආදායම් ව්‍යාප්ති විෂමතා මට්ටමයි.
    (3) ඌණ සේවා නියුක්තියයි.
    (4) ආර්ථික වෘද්ධි වේගයයි.
    (5) මානව දරිද්‍රතාවයයි.

26. බහුමානීය දරිද්‍රතා දර්ශකය පදනම් කර ගෙන ඇති විහීනතා තුන වනුයේ,
    (1) සෞඛ්‍යය, අධ්‍යාපනය හා ජීවන තත්ත්වයයි.
    (2) ආදායම් , පෝෂණය හා ආයු අපේක්ෂාවයි.
    (3) සනීපාරක්ෂාව, ළමා මර්ත්‍යයතාව හා පෝෂණයයි.
    (4) සාක්ෂරතාව, පානීය ජලය හා පාසල් ගිය වසර සංඛ්‍යාවයි.
    (5) සෞඛ්‍යය, අධ්‍යාපනය හා වත්කම් ප්‍රමාණයයි.

27. ශ්‍රී ලංකාවේ ජනගහණ උපනතීන් පිළිබඳ ව විමසා බලන විට ස්වභාවික වර්ධන අනුපාතිකය සහ ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය වෙනස් වූ ආකාරය පිළිබඳ වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

| | ස්වභාවික වර්ධන අනුපාතිකය | ශුද්ධ සංක්‍රමණ |
|---|---|---|
| (1) | පහළ ගොස් ඇත | පහළ ගොස් ඇත |
| (2) | පහළ ගොස් ඇත | ඉහළ ගොස් ඇත. |
| (3) | ඉහළ ගොස් ඇත. | පහළ ගොස් ඇත |
| (4) | ඉහළ ගොස් ඇත. | පහළ ගොස් ඇත |
| (5) | පහළ ගොස් ඇත | ශුන්‍ය වී ඇත. |

28. සමහර කර්මාන්තශාලා ස්වයංක්‍රීයකරණය වීම නිසා ඇතැම් සාම්ප්‍රදායික සේවකයන් කුසලතා නොගැලපීමකට මුහුණපාන අතර , ඔවුන්ගෙන් සමහරු සේවා වියුක්තිකයන් බවට පත් වෙති. මෙම විරැකියා ස්වරූපය වර්ග කෙරෙන සේවා වියුක්තිය වනුයේ කුමක්ද?
   (1) චක්‍රීය සේවා වියුක්තිය ලෙසය
   (2) සාර්ෂික සේවා වියුක්තිය ලෙසය
   (3) ස්වභාවික සේවා වියුක්තිය ලෙසය
   (4) ව්‍යුහමය සේවා වියුක්තිය ලෙසය
   (5) සැඟවුණු සේවා වියුක්තිය ලෙසය

29. ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්තියේ විෂමතාව මැනීම සඳහා භාවිතා කරන දර්ශකයක් වන්නේ,
   (1) ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම වේ.
   (2) මානව සංවර්ධන දර්ශකය වේ.
   (3) පංචමක අපකිරණ අනුපාතිකය වේ.
   (4) ජාතික දරිද්‍රතා ඉම වේ.
   (5) ජාත්‍යන්තර දරිද්‍රතා ඉම වේ.

30. රටක ජන සංඛ්‍යාව වෙනස් වීම කෙරෙහි බලපාන සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) සඵලතාව, මර්ත්‍යතාව සහ සංක්‍රමණ
   (2) ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය
   (3) සඵලතාව , සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය
   (4) සංක්‍රමණ , සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය
   (5) සඵලතාව, මර්ත්‍යතාව සහ ශ්‍රම බලකාය

# ආර්ථික විද්‍යාව
## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## **11. සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර**
## **බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1. | (3) | 16. | (2) |
| 2. | (1) | 17. | (3) |
| 3. | (4) | 18. | (2) |
| 4. | (2) | 19. | (4) |
| 5. | (3) | 20. | (5) |
| 6. | (1) | 21. | (4) |
| 7. | (1) | 22. | (2) |
| 8. | (2) | 23. | (3) |
| 9. | (2) | 24. | (2) |
| 10. | (5) | 25. | (2) |
| 11. | (3) | 26. | (1) |
| 12. | (5) | 27. | (2) |
| 13. | (3) | 28. | (4) |
| 14. | (4) | 29. | (3) |
| 15. | (1) | 30. | (1) |

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 11. සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායකවීමේ ඇල්ම
# ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1.
(i) ආර්ථික වෘද්ධිය යනු කුමක්ද? ආර්ථික වෘද්ධි අනුපාතිකයකින් එය වෙනස් වන්නේ කෙසේද?
(ii) ආර්ථික වෘද්ධියේ ප්‍රධාන මූලාශ්‍ර සඳහන් කරන්න.
(iii) ආර්ථික වෘද්ධිය ජීවිතයේ ගුණාත්මක තත්ත්වය ඉහළ නංවා ගැනීම සඳහා පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය කෙරෙන කොන්දේසි කවරේ ද?
(iv) රටක ජීවන තත්ත්වය මැනීමෙහි ලා දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ දුර්වලතා සඳහන් කරන්න.
(v) දිගු කාලීන ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීම පිණිස ආණ්ඩුවට ගත හැකි ක්‍රියා මාර්ග 5ක් සඳහන් කරන්න.

2.
(i) ආර්ථික වෘද්ධිය නිර්වචනය කොට ආර්ථික වෘද්ධියේ ඉතා වැදගත් මූලාශ්‍ර සඳහන් කරන්න.
(ii) දිළිඳුකම තුරන් කිරීම සඳහා ආර්ථික වෘද්ධිය ප්‍රමාණවත් කොන්දේසියක් වේද? පිළිතුර පැහැදිලි කරන්න.
(iii) ආර්ථික සංවර්ධනය නියෝජනය කිරීම සඳහා ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය යොදා ගැනීමේ වාසි අවාසි සැකෙවින් පැහැදිලි කරන්න.
(iv) ලෝක බැංකුව ඒ ඒ රටවල ප්‍රතිශීර්ෂ ආදායම් මට්ටම පදනම් කර ගනිමින් රටවල් වර්ගීකරණය කරනුයේ කෙසේ ද?
(v) රටක ඵලදායිතා මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක කවරේ ද?

3.
(i) ආර්ථික වෘද්ධිය යන්න නිර්වචනය කරන්න. එය මනිනු ලබන්නේ කෙසේද?
(ii) නිෂ්පාදන ධාරිතාවය යන සංකල්පය පැහැදිලි කරන්න.
(iii) කිසියම් රටක නිෂ්පාදන ධාරිතාව තීරණය කරන මූලික සාධක කවරේ ද?
(iv) රටක ආර්ථික වෘද්ධිය සමග ජාතික නිෂ්පාදිතයෙහි ඇතිවිය හැකි ව්‍යුහාත්මක වෙනස්කම් පැහැදිලි කරන්න.
(v) "ආර්ථික සංවර්ධනය බහුමාන ක්‍රියාවලියකි". පැහැදිලි කරන්න.
(vi)

4.

(i) "සංවර්ධනය වූ කලී බහුමාන ක්‍රියාවලියකි". පැහැදිලි කරන්න.

(ii) තිරසාර සංවර්ධනය යන්නෙන් කවරක් අදහස් වේ ද?

(iii)සංවර්ධනය මැනීමෙහි ලා මානව සංවර්ධන දර්ශකයෙහි ඇති ප්‍රධාන සීමාකම් කවරේ ද?

(iv)"ජීවිතයේ ගුණාත්මක තත්ත්වය මිනුම් කිරීම සඳහා ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායමේ වෘද්ධිය ප්‍රමාණවත් මිනුමක් නොවේ". පැහැදිලි කරන්න.

(v) සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ අතුරෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත්තේ කවර ක්ෂේත්‍රයන් පිළිබඳව ද?

5.

(i) මානව සංවර්ධනය යනු කුමක්ද? සංවර්ධනය පිළිබඳ අවශේෂ මිනුම් සමග බලන විට මානව සංවර්ධන දර්ශකයේ වාසි අවාසි කවරේද?

(ii) ආර්ථික වෘද්ධිය සහ තිරසර සංවර්ධනය එකිනෙක නොගැළපෙන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(iii) "ශ්‍රී ලංකාව මානව සංවර්ධනය සම්බන්ධයෙන් ජාතික මට්ටමෙන් ලබාගෙන ඇති ජයග්‍රහණ සිත් ගන්නා සුලු වුව ද ප්‍රාදේශීය වශයෙන් හා ආංශික වශයෙන් මානව සංවර්ධනයේ අසමානතා තවදුරටත් දක්නට ලැබේ". පැහැදිලි කරන්න.

(iv) බහුමාන දරිද්‍රතා දර්ශකය යනු කුමක් ද ?

(v) ශ්‍රී ලංකාවේ දිළිඳුකමේ මෑතකාලීන උපනතීන් විස්තර කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන කොට්ඨාශය

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
# සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 11. සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායකවීමේ ඇල්ම
# ව්‍යූහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1.

(i) ආර්ථිකයක භාණ්ඩ හා සේවා නිපදවීමේ හැකියාවේ තිරසාර ප්‍රසාරණයක් හෙවත් විභව දළ දේශීය හෝ ජාතික නිෂ්පාදිතයේ අඛණ්ඩ වැඩිවීමක් ආර්ථික වෘද්ධිය ලෙස සැලකේ. ආර්ථිකයක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පිළිබඳ ප්‍රමාණාත්මක වෙනස්වීමක් මෙමගින් පෙන්නුම් කරයි. ආර්ථික වෘද්ධියක් නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන්වීම මගින් පෙන්නුම් කළ හැක.

කාලච්ඡේද දෙකක් අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ හට ගන්නා වැඩිවීම ආර්ථික වෘද්ධි අනුපාතිකය මගින් පෙන්වයි.

$$\text{ආර්ථික වෘද්ධි අනුපාතිකය} = \frac{\text{සමීප වර්ෂ දෙකක මූ.ද.දේ.නි.වෙනස}}{\text{පෙර වසරේ මූ.ද.දේ.නි}} X\ 100$$

(ii)

- සම්පත් සම්භාරය
  - භෞතික ප්‍රාග්ධනය ( කටයුතු පහසු කරන මෙවලම් හා උපකරණ, යටිතල පහසුකම් )
  - මානව ප්‍රාග්ධනය ( ශ්‍රම හමුදාව විසින් සමුච්ඡනය කරන ලද දැනුම , කුසලතා, අත්දැකීම් සම්භාරය)
  - ස්වභාවික ප්‍රාග්ධනය (භූමිය , ගංගා , ඇළදොළ, ඛනිජ සම්පත් )
  - සමාජ ප්‍රාග්ධනය (සමාජ අන්තර් සම්බන්ධතා ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කරන ආයතන , ප්‍රතිමාන, සාරධර්ම, සමිති සාමාජිකත්වයන්, සම්බන්ධතා ජාල)
- සාධක ඵලදායිතාව
  - තාක්ෂණික දැනුම (වඩාත් කාර්යක්ෂම ක්‍රම ශිල්ප පිළිබඳ දැනුම , නවෝත්පාදන )
  - ශ්‍රම විභජනය
  - කළමනාකරණය
  - පර්යේෂණ හා සංවර්ධනය සඳහා කරන ආයෝජනය
- රාජ්‍ය ප්‍රතිපත්ති (ඉතුරුම් සහ ආයෝජන ප්‍රවර්ධනය, අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම, දේපොළ අයිතිය තහවුරු කිරීම, වෙළෙඳාම නිර්බාධකරණය කිරීම, පර්යේෂණ හා සංවර්ධනය සඳහා කරන ආයෝජනය)
- ආර්ථික ස්ථායිකරණය (උද්ධමන අවධමන වලින් තොර වීම)
- සානුබල සැපයීම (වෙළෙඳපොළවල් , දේපොළ අයිතිවාසිකම්, මුදල් හුවමාරුව)
- යහපාලනය ( සහභාගීත්වය, එකඟතාව, වගවීම, සඵලතාව හා කාර්යක්ෂමතාව, සංවේදීබව, සාධාරණත්වය හා නීතියේ ආධිපත්‍යය යන ප්‍රධාන ක්ෂේත්‍ර මේ යටතේ ආවරණය වේ.)

(iii)

- කාර්මීකරණය වේගවත් වීම (ආර්ථික සංවර්ධයේ මුල් අදියරේදී මුළු නිෂ්පාදනයට සහ සේවා නියුක්තියට කාර්මික අංශයේ දායක්වය ඉහළ යයි. නිෂ්පාදන ක්‍රම ශිල්ප සඳහා මානව ප්‍රාග්ධනය හා භෞතික ප්‍රාග්ධනය සාපේක්ෂ වශයෙන් වැඩිපුර යොදාගනී. නාගරික ජනගහනයේ ප්‍රමාණය ඉහළ යයි)
- සේවා අංශය ආර්ථිකයේ වැදගත්ම අංශය වීම (සංවර්ධනයේ පරිණත අවධිය කරා ළඟාවන විට සේවා අංශය වඩාත් ශක්තිමත් වීම)
- කෘෂි අංශයේ සාපේක්ෂ දායකත්වය අඩු වීම (කාර්මික අංශය ප්‍රසාරණයට සමාන්තරව කෘෂි අංශය සංකෝචනය වේ. මුළු නිෂ්පාදිතයට හා සේවා නියුක්තියට දක්වන දායකත්වය අඩු වීම, ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය පහළ වැටීම, කෘෂි අංශයේ අතිරික්ත ශ්‍රමය ඉහළ වැටුප් ලබන කාර්මික අංශයට මාරුවීම)
- වෙළෙඳ රටාවේ වෙනස්කම් (සාම්ප්‍රදායික ප්‍රාථමික අපනයන වෙනුවට විවිධාංගීකරණය වූ කාර්මික අපනයන ව්‍යුහයක් බිහි වීම හා අපනයන සංයුතිය වෙනස් වීම)
- නිෂ්පාදන සම්පත් වල ඵලදායීතාව ඉහළ යාම (මානව ප්‍රාග්ධනය සමුච්චනය කිරීම , භෞතික ප්‍රාග්ධනය සමුච්චනය, උසස් තාක්ෂණය භාවිතා කිරීම)
- නිෂ්පාදන ක්‍රම ශිල්ප හා තාක්ෂණය උසස් වීම (ශ්‍රම සූක්ෂම ශිල්ප ක්‍රම වෙනුවට ප්‍රාග්ධන සූක්ෂම ශිල්ප ක්‍රම වෙත යොමු වීම)
- නවීකරණය වීම
- ආයතනික වෙනස්කම් සිදු වීම (රජය ආර්ථිකය පාලනය කරන්නකුගේ භූමිකාවේ සිට පහසුකම් හා සානුබල සපයන්නකුගේ කාර්යය දක්වා ගමන් කිරීම, කාර්යක්ෂයම මූල්‍ය ආයතන පද්ධතියක් ගොඩ නැංවීම, නෛතික පද්ධතිය ස්ථාපිත කිරීම සහ දේපොළ අයිතිය සුරක්ෂිත කිරීම, නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම, කාර්යක්ෂම නියාමන ක්‍රමයක් ගොඩ නැංවීම)

(iv)

- ද්විගණන දෝෂ හට ගැනීම.
- භාණ්ඩවල ගුණාත්මක තත්ත්වයේ හටගෙන ඇති දෝෂයන් පෙන්නුම් නොකිරීම.
- වෙළෙඳපොළ හරහා ගනුදෙනු නොවන , ඵලදායී ගනුදෙනු වල එකතු කළ අගයන් ඇතුළත් නොවීම.
- අවගුණ භාණ්ඩ නිෂ්පාදන දත්ත ඇතුළත් වීම.
- සෘණ බාහිරතා සැලකිල්ලට නොගැනීම.
- ආදායම් බෙදී යන ආකාරය පෙන්නුම් නොකිරීම.
- ආර්ථිකයේ හටගන්නා ව්‍යුහාත්මක වෙනස්කම් පෙන්නුම් නොකිරීම.
- රටවල් අතර සංවර්ධන මට්ටම සැසඳීම සඳහා නාමික විනිමය අනුපාතික යොදාගනිමින් ඩොලර් ඒකක වලින් ප්‍රකාශ කිරීම.

(v)

- යටිතල පහසුකම් සංවර්ධනය
- මානව ප්‍රාග්ධනය සංවර්ධනයේ ලා (අධ්‍යාපනය හා පුහුණුව) ආයෝජනය කිරීම
- සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
- පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ ආයෝජනය ඉහළ නැංවීම
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- අපනයන විවිධාංගීකරණය.
- නම්‍යශීලී ශ්‍රම වෙළෙඳපොළක් බිහි කිරීම.
- වෘත්තීය සමිති සමඟ යහපත් සම්බන්ධතා ගොඩනැංවීම.
- යහපාලනය ශක්තිමත් කිරීම.

2.

(i) රටක නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ඉහළ යාමක් ආර්ථික වෘද්ධිය ලෙස සැලකේ. කාලයක් තිස්සේ මූර්ත ජාතික නිෂ්පාදිතයේ සහ ආදායමේ සිදුවන අඛණ්ඩ වැඩිවීමක් මගින් එය හඳුනා ගත හැක.

ආර්ථික වෘද්ධියේ මූලාශ්‍ර

- සම්පත් සම්භාරය ඉහළ යාම
  - භෞතික ප්‍රාග්ධනය
  - මානව ප්‍රාග්ධනය
  - සමාජ ප්‍රාග්ධනය
  - ස්වභාවික ප්‍රාග්ධනය
- ඵලදායීතාවය ඉහළ යාම
  - තාක්ෂණික දියුණුව
  - නවෝත්පාදන
  - පර්යේෂණ හා සංවර්ධනය ආයෝජනය ඉහළ යාම
  - කළමනාකරණය උසස් වීම
- ආර්ථික ස්ථායීතාවය
- ව්‍යවසායකත්ව හැකියා වර්ධනය
- අබාධ වෙළෙඳාම හා ආයෝජනය
- සානුබල සැපයීම
- දේශපාලන හා සමාජ ස්ථාවරත්වය
- යහපාලනය තහවුරු කිරීම

(ii)

- ආර්ථික වෘද්ධිය , දරිද්‍රතාව දුරුලීමේ ප්‍රබල බලවේගයක් ලෙස පිළිගැනේ.
- වෘද්ධිය නිසා සමාජයට සෞභාග්‍යය හා ආර්ථික අවස්ථා බිහි කෙරේ. රැකියා අවස්ථා ප්‍රසාරණය නිසා දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට දෙමාපියන් පෙළඹේ. නමුත් මෙය රටවල සමාජ ආර්ථික පරිසරය අනුව වෙනස් විය හැක.
- වෘද්ධි ප්‍රතිලාභ භුක්ති විඳීමට දිළිඳු ජනයාට අවස්ථාව ලැබේ ද ? නැද්ද?
- වෘද්ධිය සඳහා දිළිඳු ජනයා කෙතෙක් දුරට දායක වේ ද යන්න
- වෘද්ධිය නිසා ආදායම් විෂමතා වර්ධනය වන බැවින් දිළිඳුකම දුරුලීමට වෘද්ධියේ දායකත්වය අඩු විය හැක.
- වෘද්ධිය තුළින් දිළින්දන්ට ප්‍රතිලාභ ලැබෙන ඌනපූරණ ක්‍රියාවට නැංවේ ද නැද්ද යන්න
- වෘද්ධි ක්‍රියාවලිය සමඟ සමාජ ආරක්ෂණ ජාලා ක්‍රියාත්මක වීම අවශ්‍යය
- වෘද්ධිය සාර්ව සහභාගීත්ව ක්‍රියාවලියක් විය යුතුය.

(iii) ප්‍රතිශීර්ෂ ආදායමේ වර්ධනය යොදා ගැනීමේ වාසි

- ගණනය කිරීම පහසු නිසා ලොව පුරා රටවල් භාවිතා කිරීම
- සංවර්ධනයට අදාල සාක්ෂරතාව , සෞඛ්‍යය පහසුකම් , අධ්‍යාපනය වැනි වැදගත් විචල්‍යයන් රැසක් ප්‍රතිශීර්ෂ ආදායම් මට්ටම සමඟ සහසම්බන්ධතාවක් දක්වයි.

ප්‍රතිශීර්ෂ ආදායමේ වර්ධනය යොදා ගැනීමේ අවාසි

1. භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය කැටිකොට දක්වන නමුත් සංවර්ධනයට අදාල ගුණාත්මක වෙනස්කම් නොපෙන්වයි
2. ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය නිවැරදිව නොපෙන්වයි
3. සංවර්ධනයට අදාල තිරසාර සංවර්ධන පැතිකඩ නොසලකා හරියි (පරිසර දූෂණය, ස්වභාවික ප්‍රාග්ධනය ක්ෂයවීම ආදිය මෙමඟින් නොපෙන්වයි)
4. සංතුෂ්ඨිය, සෞඛ්‍යය , මානව අයිතිවාසිකම් වැනි ආදායම් නොවන සංවර්ධනයේ පැතිකඩවල් පිළිබඳ නොසලකා හරියි
5. නොවිධිමත් අංශයේ නිෂ්පාදනය නිවැරදිව පිළිබිඹු නොකෙරේ.
6. අන්තර්ජාතික සංසන්දනයේ දී සිදුවන විනිමය අනුපාතික පිළිබඳ ගැටළු
7. දරිද්‍රතාව, විරැකියාව, වැනි සමාජ ආර්ථික විචල්‍යයන් ගේ හැසිරීම නොපෙන්වයි.

(iv)

1. පහළ ආදායම් ලබන රටවල් (ඇ.ඩො.1046ට අඩු)
2. පහළ මැදි ආදායම් ලබන රටවල් ( ඇ.ඩො. 1046 – 4095 අතර)
3. ඉහළ මැදි ආදායම් ලබන රටවල් (ඇ.ඩො. 4096 – 12696 අතර)
4. ඉහළ ආදායම් ලබන රටවල් (ඇ.ඩො. 12697 ට වැඩි)

(v)

- ශ්‍රමයේ ගුණාත්මක තත්ත්වය (අධ්‍යාපනය , වෘත්තීය පුහුණුව හා අත්දැකීම්)
- තාක්ෂණය
- නව්‍යතා සම්පාදනය
- ප්‍රාග්ධන ආයෝජනය
- මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය
- ස්වභාවික සම්පත්
- යටිතල පහසුකම්
- නියාමනය
- ආකල්ප හා ප්‍රතිමාන

3.

(i) මූර්ත දළ දේශීය / ජාතික නිෂ්පාදිතයේ අඛන්ඩ වර්ධනය වීමක් වෘද්ධිය ලෙස හැඳින්වේ. එහිදී ආර්ථිකයේ විභවතාවයේ දිගුකාලීන ප්‍රසාරණයක් සිදු වේ.

වෘද්ධිය මනින ක්‍රම දෙකකි

1. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ / දළ ජාතික නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතයක් ලෙස වෙනස් වීම.
2. ප්‍රති ශීර්ෂ මූර්ත දළ දේශීය / දළ ජාතික නිෂ්පාදිතය වෙනස්වීම

(ii) ආර්ථිකයක තිරසාර ලෙස උද්ධමන පීඩනයකින් තොරව , නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති මුළු භාණ්ඩ හා සේවා ප්‍රමාණය රටක නිෂ්පාදන ධාරිතාවය ලෙස සැලකේ . ආර්ථිකයක ප්‍රාග්ධනය හා ශ්‍රමය පූර්ණ ලෙස හා කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ හොත් නිපදවිය හැකි භාණ්ඩ හා සේවා තොගයයි. විභව නිමැවුම, නිෂ්පාදන හැකියාව යන විකල්ප නම් වලින් ද හඳුන්වයි .

(iii)

1. භෞතික ප්‍රාග්ධනය
2. මානව ප්‍රාග්ධනය
3. ස්වභාවික ප්‍රග්ධනය
4. සමාජ ප්‍රාග්ධනය
5. තාක්ෂණය.ඵලදායිතාවය

(iv) ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය තුළදී ,

1. කෘෂිකාර්මික , කාර්මික හා සේවා යන අංශ තුනෙහි ම ප්‍රසාරණයක් ඇති වේ.
2. කෘෂි අංශයට වඩා වැඩි වේගයකින් කාර්මික අංශය ප්‍රසාරණය වේ
3. සේවා අංශය ආර්ථිකයේ වැදගත් ම අංශය බවට පත් වේ

(v)

- ආර්ථික සංවර්ධනය යනු බහුමාණ ක්‍රියාවලියකි. එහිදී මිනිස් ජීවිතයේ ආර්ථික තත්ත්වය හා ගුණාත්මක තත්ත්වය ඉහළ යාමක් සිදු වේ.

- ආර්ථික සංවර්ධනය සඳහා ආර්ථික වෘද්ධියත් සමඟ පහත වෙනස්කම් සිදු විය යුතුය.
    - නිෂ්පාදන අංශයෙහි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු වීම
    - නිෂ්පාදන සම්පත්වල ඵලදායීතාවය ඉහළ යාම
    - නිෂ්පාදන ශිල්පක්‍රම හා තාක්ෂණය ඉහළ යාම
    - නවීකරණය වීම
    - ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ ඉහළ සිට පහළට ගොස් දුගීබව අඩු වීම, විරැකියාව අඩු වීම, ආදායම් විෂමතාව අඩු වීම, තේරීම් ඉහළ යාම ආදිය ආර්ථික සංවර්ධනයේ දී සිදු වේ
    - ආර්ථික, සමාජ , දේශපාලන, සංස්කෘතික , පාරිසරික ආදී සෑම අංශයක ම දියුණුවක් ඇති වන නිසා ආර්ථික සංවර්ධනය බහුමානීය ක්‍රියාවලියකි.

4.

(i)

- සංවර්ධනය වූ කලී බහුමානීය ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය තුළ ආර්ථික පැතිකඩ මෙන්ම ආර්ථික නොවන පැතිකඩ ද එක සේ වැදගත් වේ.එබඳු සංවර්ධන ක්‍රියාවලියක් වෘද්ධිය හා සාධාරණත්වය වැනි අරමුණු සමගාමී ව සාක්ෂාත් කර ගත යුතුය.

- සංවර්ධනය යනු ජීවිතයේ ගුණාත්මක තත්ත්වය උසස් වීම ය. 'බහුමාන ක්‍රියාවලිය' යන්නෙන් අදහස් වන්නේ සංවර්ධනය යනු හුදෙක් තනි සාධකයක් නොවන බවය. සමාජ සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, පාරිසරික කළමනාකරණය , ස්ත්‍රී පුරුෂ සමානතාව, දේශපාලනික සවිබල ගැන්වීම , ප්‍රජා විද්‍යාත්මක සංවර්ධනය වැනි පුළුල් ක්ෂේත්‍ර රැසක් එමගින් ආවරණය කෙරේ.

(ii)

- තිරසාර සංවර්ධය යන්නෙන් අදහස් කරනුයේ වර්තමාන පරපුර තම අවශ්‍යතා සපුරාගත යුත්තේ අනාගත පරම්පරාවලට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය කැප නොකරමින් බවයි.

- තිරසාර සංවර්ධනයේ හරය වශයෙන් පවතිනුයේ තීරණ ගැනීමේ දී ප්‍රධාන ස්තම්භ තුනක් එකවර සැලකිල්ලට ගත යුතු බවයි. එනම් සමාජය, ආර්ථිකය සහ පරිසරයයි

- සමාජය, ආර්ථිකය සහ පරිසරය ඉතා කිට්ටුවෙන් එකිනෙක බැඳී පවත්නා බැවින් තීරණ ගත යුත්තේ ඒවා අතර සමබරතාවක් පවත්වා ගැනීමට හැකි වන පරිදි ය.

- සංවර්ධනය තිරසාර වනුයේ මෙම අංශ අතර මනා සම්බන්ධයක් හා සමබරතාවක් තිබුණහොත් පමණි. එක් අංශයක් පසෙක ලා තවත් අංශයක් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමෙන් , සමස්ත සංවර්ධන ක්‍රියාවලිය ම පසු බෑමකට ලක් වනු ඇත.

(iii)

- මානව සංවර්ධනය ගොඩනැගීමේදී ප්‍රධාන මානයන්ට සමාන බර තැබීමක් (1/3) සිදු කිරීම
- මානව සංවර්ධන දර්ශකය සමාහාර මිනුමක් නිසා විවිධ විෂමතා සැලකිල්ලට නොගැනීම ( උදා:- ස්ත්‍රී පුරුෂ බව අනුව , ග්‍රාමීය නාගරික බව අනුව, ආදායම් ව්‍යාප්තියේ පවතින විෂමතා අනුව)
- මානව සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ඇතැම් අංග සලකා නොබැලීම (උදා:- මානව නිදහස හා මානව ආරක්ෂාව, දේශපාලන නිදහස, සහභාගීත්වය)
- අධ්‍යාපනය මිනුම් කිරීමේදී අතරමගදී පාසල් හැර යන ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිල්ලට නොගැනීම නිසා පාසල් වලට ඇතුළත් වීමේ අනුපාතය අධි තක්සේරු වීම
- පාරිසරික බලපෑම් ඇතුළත් නොවීම

(iv)

- ඒක පුද්ගල දළ ජාතික ආදායමේ වර්ධනයක් යනු පෙර වර්ෂයකට සාපේක්ෂව බලන කල පුද්ගලයෙකුට දළ ජාතික ආදායමෙන් හිමි වන සාමාන්‍ය ආදායමේ ඉහළ යාමයි. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය සාමාන්‍ය ජාතික ආදායම පමණක් පෙන්නුම් කරන අතර , එය ජීවන තත්ත්වය මිනුම් කිරීමට ප්‍රමාණවත් මිනුමක් නොවේ.
- ජීවන තත්ත්වය යන්න විෂයානුබද්ධ සංකල්පයක් වන අතර , එමගින් පුද්ගල සතුට, සාධාරණත්වය, සමානාත්මතාවය සහ පුද්ගල ගරුත්වය , මානව අයිතීන් , වෙනස්කොට සැලකීමෙන් නිදහස් වීම, ස්ත්‍රී පුරුෂ භාවය , ජාතිය, භාෂාව, ආගම, දේශපාලන විශ්වාසයන්, ජාතිකත්වය සහ සමාජ ආර්ථික තත්ත්වය ආදිය නොසලකා සමානව සැලකීම ද ඇතුළත් වේ.
- පුද්ගලයාගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක බවට බලපාන තවත් සමහර සාධක අතරට සේවා ස්ථානයේ කොන්දේසි , සෞඛ්‍යය සේවා , අධ්‍යාපනය හා ද්‍රව්‍යාත්මක ජීවන තත්ත්වයන් ද ඇතුළත් කළ හැකි වේ.
- එබැවින් ඒක පුද්ගල දළ ජාතික ආදායමේ වර්ධනය ජීවන තත්ත්වය මිනුම් කිරීමේ දී නොමග යවන සුළු සහ ප්‍රමාණවත් නොවන මිනුමකි.

(v)

- ආදායම් දරිද්‍රතාව අඩු කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළු වීමේ අනුපාතිකය 100% දක්වා වැඩි කිරීම.
- ළමා මරණ සංඛ්‍යාව පහළ හෙළීම.
- මාතෘ සෞඛ්‍යය ඉහළ නැංවීම.
- මැලේරියා රෝගී මරණ සංඛ්‍යාව ශුන්‍ය කිරීම.
- ක්ෂය රෝගී මරණ සංඛ්‍යාව ශුන්‍ය කිරීම.

5.

(i) මානව සංවර්ධන දර්ශකය යනු දැනුම , ජීවන මට්ටම සහ සෞඛ්‍යය යන ප්‍රධාන පැතිකඩ 3ක් පදනම් කර ගනිමින් ගණනය කරනු ලබන සංයුක්ත දර්ශකයකි.

මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා

- රටක ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අදාල ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන අංශ දෙකම ඇතුළත් වී තිබීම.
- සංවර්ධනයේ යෙදවුම් පාර්ශ්වය මෙන්ම නිමැවුම් පාර්ශ්වයද නියෝජනය වී තිබීම (උදා: ලෙස ආයු අපේක්ෂාව , වැනි සමාජීය දර්ශක ගණනයේදී රටක සිටින විශේෂඥ වෛද්‍යවරුන් ගණන, රෝහල් වල ඇති ඇඳන් ගණන, එක් වෛද්‍යවරයකුට සිටින රෝගීන් ගණන ආදී යෙදවුම් භාවිතා වේ. උපතේදී දී ඉහළ ජීවිත අපේක්ෂාවක් තිබීම එම යෙදවුම් වලින් ලැබෙන නිමැවුම වේ.)
- සංවර්ධන මට්ටම අනුව රටවල් වර්ග කිරීමට පදනමක් සැපයීම
- ජනතාව හා සංවර්ධනය ඒකාබද්ධ කිරීම මගින් සංවර්ධනය මැනීම සඳහා අර්ථවත් පුළුල් සමාහාර මිනුමක් ලබා ගත හැකි වීම

මානව සංවර්ධන දර්ශකයේ දුබලතා

- මානව සංවර්ධනය ගොඩනැගීමේදී ප්‍රධාන මානයන්ට සමාන බර තැබීමක් (1/3) සිදු කිරීම
- මානව සංවර්ධන දර්ශකය සමාහාර මිනුමක් නිසා විවිධ විෂමතා සැලකිල්ලට නොගැනීම (උදා:- ස්ත්‍රී පුරුෂ බව අනුව , ග්‍රාමීය නාගරික බව අනුව, ආදායම් ව්‍යාප්තියේ පවතින විෂමතා අනුව)
- මානව සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ඇතැම් අංග සලකා නොබැලීම (උදා:- මානව නිදහස හා මානව ආරක්ෂාව, දේශපාලන නිදහස, සහභාගීත්වය)
- අධ්‍යාපනය මිනුම් කිරීමේදී අතරමගදී පාසල් හැර යන ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිල්ලට නොගැනීම නිසා පාසල් වලට ඇතුළත් වීමේ අනුපාතය අධි තක්සේරු වීම
- පාරිසරික බලපෑම් ඇතුළත් නොවීම

(ii)

- ආර්ථික වෘද්ධිය නිසා ආදායම් මට්ටම් ඉහළ යයි. භෞතික ජීවන තත්ත්වය ඉහළ යාමට ඉහළ ආදායම් අවශ්‍යයි. මේ නිසා ආර්ථික වෘද්ධිය, තිරසාර සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වේ.
- ආර්ථික වෘද්ධිය ඉහළ යාම නිසා හිඟ සම්පත් උපයෝජනය ඉහළ යයි.එමනිසා ස්වභාවික ප්‍රාග්ධනය හායනය වේ. සමාජ විෂමතා වැඩි වේ. වර්තමාන ආදායම් මට්ටම් ඉහළ යාම අනාගත ආදායම් විභවතාව පහළ යාමට හේතු වේ.
- පරිසර දූෂණය ජනගහනය සමග සෘජු සම්බන්ධයක් පවතී . එහෙත් ජනගහණ වර්ධනය, ආර්ථික වෘද්ධිය සමඟ ප්‍රතිලෝම සම්බන්ධ වේ. එම නිසා ආර්ථික වෘද්ධි මට්ටම පරිසරයට හිතකර ලෙස බලපායි.
- වෘද්ධියත් සමඟ සමාජ සාරධර්ම , ප්‍රතිමාන වෙනස් වී , සමාජ විෂමතා හා පාරිසරික ගැටළු කෙරෙහි වැඩි අවධානය යොමු කෙරේ. පරිසර හිතකාමී භාණ්ඩ වැඩිපුර නිපදවීමට යොමු වේ.
- වෘද්ධියත් සමඟ ආදායම් ඉහළ යන නිසා තාක්ෂණ , පර්යේෂණ හා සංවර්ධනය, නවෝත්පාදන කෙරෙහි වැඩි අවධානය යොමු කර , ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් වෙනුවට පරිසර හිතකාමී වෙනත් ක්‍රම භාවිතා කළ හැක.

(iii)

- සාර්ක් කලාපීය රටවල් අතුරින් ශ්‍රී ලංකාව ඉහළ ම මානව සංවර්ධන දර්ශකය පෙන්වයි. 2020 වාර්තාව අනුව මෙරට මානව සංවර්ධන දර්ශකය 0.782 ක් වන අතර රටවල් 187 අතුරින් 72 වැනි ස්ථානය හිමි කර ගෙන ඇත.
- ජාතික දරිද්‍රතා අනුපාතිකය 1990/91 වර්ෂවල 26.1% ක් වූ අතර 2009/10 වර්ෂවල එය 8.9%ක් දක්වා අඩු විය.
- මෙලෙස ජාතික මට්ටමින් මානව සංවර්ධන දර්ශකයේ කැපී පෙනෙන වෙනස්කම් සිදු වුවත් , පළාත් , දිස්ත්‍රික් හා ආංශික වශයෙන් එහි විෂමතා පවතී.
  - නාගරික අංශයේ දරිද්‍රතාව - 5.3%
  - ග්‍රාමීය අංශයේ දරිද්‍රතාව - 9.4%
  - වතු අංශයේ දරිද්‍රතාව - 11.0%
- දළ දේශීය නිෂ්පාදිතයේ විශාලතම දායකත්වය බස්නාහිර (44%)
- අඩුම දායකත්වය උතුරු පළාත (4%)
- යටිතල පහසුකම් - වතු අංශයේ 23% කට විදුලිය ද , 40 %කට පිරිසිදු පානීය ජලය ද නොලැබේ.
- ද්විතියික හා උසස් අධ්‍යාපනය සඳහා ඇති පහසුකම් ව්‍යාප්තියේ ද වෙනස්කම් පවතී.

(iv) ජනගහන දරිද්‍රතා දර්ශකය හා විහීනතා දර්ශකය යන දෙකෙහි සාමාන්‍ය අගයන් එකිනෙකින් ගුණ කරමින් බහුමාන දරිද්‍රතා දර්ශකය ලබාගනී.

බහුමාන දරිද්‍රතා දර්ශකය = ජනගහන දරිද්‍රතා දර්ශකය * විහීනතා දර්ශකය

(v)

1. ආර්ථික ප්‍රතිවිපාක
   - ~ නිෂ්පාදන කාර්යක්ෂමතාව හීන වීම
   - ~ ඌන සම්පත් උපයෝජනය.
   - ~ නූගත්කම නිසා විරැකියාව ඉහළ යාම
   - ~ ජාතික නිෂ්පාදිතය හා ප්‍රතිශීර්ෂ ආදායම පහළ යාම

2. සමාජීය ප්‍රතිවිපාක
   - ~ සමාජ අසමානතාව, බැහැර කිරීම, නොසලකා හැරීම වැනි අකටයුතුකම් නිසා මංකොල්ලකෑම් , සොරකම්, අල්ලස් ගැනීම්, මිනී මැරුම් වැනි අපරාධ තවදුරටත් ඉහළ යාම.
   - ~ සමාජ සාධාරණත්වයට හා යහ පැවැත්මට ප්‍රබල හානියක් වීම.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”